ගෝලීය ව්‍යාප්ත වසංගතයක් බවට පත්ව ඇති කොවිඩ්-19 සමගින් අපි රටක් ලෙසින් එක්ව සටන් වදිමින් සිටිමු. මෙහිදී මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා රජය හා අදාළ අංශ මගින් පනවනු ලබන රෙගුලාසි සහ ක්‍රියාමාර්ගයන්ට අනුකූලව කටයුතු කිරීම සෑම පුරවැසියෙකුගේම වගකීමයි. එසේම එම ක්‍රියාමාර්ගයන්ට සහයෝගය දීම, නිවැරදි වාර්තාකරණය සහ වාර්තා කිරීමේ කටයුතු නිසි ආචාර ධර්මානුකූලව, පුද්ගලයින්ගේ ගෞරවය සහ පෞද්ගලිකත්වය සුරක්ෂිත කරමින් ඉටු කිරීම ජනමාධ්‍යයන්ගේ වගකීමයි. අප විසින් එය ඇතැම් විටක කඩ වන තැනක් පෙන්වා දෙන්නේ, ඒ ඔස්සේ ජනමාධ්‍යයන්ට එය නිවැරදි කරගැනීමට අවකාශ සැලසීම උදෙසායි.

උදාහරණයක් ලෙසට දෙරණ, ස්වාධීන රූපවාහිනී, ජාතික රූපවාහිනී, හිරු සහ ස්වර්ණවාහිනී යන රූපවාහිනී නාලිකා ඔස්සේ ඇඳිරි නීතිය කඩකරනා පුද්ගලයින්, මුඛ ආවරණ නොපැළඳ සිටිනා පුද්ගලයින්, බස් රථ වල ගමන් ගන්නා පුද්ගලයින් සම්බන්ධයෙන් ඉදිරිපත් වන පුවත් වාර්තාවන් කිහිපයක් දෙස අවධානය යොමු කළ හැක. මෙහිදී අපට නිරීක්ෂණය කළ හැකි වූයේ, එම සියලුම දෙනාගේ අනන්‍යතාවය පැහැදිලිවම හෙළි වන පරිදි, මුහුණු බොඳ කිරීමක් හෝ වෙනත් එවන් පියවරකින් තොරව එම වීඩියෝවන් ප්‍රවෘත්ති විකාශයන් ඔස්සේ විකාශනය වූ බවයි.

මෙහිදී මෙම අදාළ මෙහෙයුම් සිදුවන බව සහ රටේ සැබෑ තත්වය මාධ්‍ය ඔස්සේ පෙන්වා දීම යහපත් කරුණකි. ඒ ඔස්සේ මෙම වසංගතයක් පවතින මොහොතේ ඇඳිරි නීතිය රැකීමේ වැදගත්කම යනාදී දෑ අවධාරණය කිරීමද යහපත් කරුණකි. එසේ වුවත්, එය ඉටු කිරීමේදී පුද්ගලයෙකුට සිය පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය උල්ලංඝනය කිරීම, පුද්ගල ගරුත්වය ආරක්ෂා නොකිරීම කිසිසේත්ම යහපත් කරුණක් නොවේ. මෙහිදී පුද්ගල ගරුත්වය ආරක්ෂා කරමින් එම දර්ශන පෙන්වීමට නොහැක්කේද නොවේ. එය මේ මොහොතේ ජනමාධ්‍යය අත ඇති වගකීමෙන් කොටසක්ද වෙයි. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #TV #News #TVDerana #HiruTV #Swarnavahini #Rupavahini #COVID19 #Coronavirus**